# සහභාගිත්ව සංවර්ධන ප්‍රවේශය සහ නාගරික පැල්පත් වාසී ප්‍රජා සංවර්ධනය සඳහා එහි දායකත්වය

ඉන්දිකා පතිරණ

## සංක්ෂේපය

සංවර්ධන ප්‍රයත්නයන් හි දී වඩා වැදගත් වන්නේ, සංවර්ධනය විය යුතු අංශ හඳුනා ගනිමින් සංවර්ධනය සඳහා අදාළ ක්‍රමවේදයන් අනුගමනය කිරීම යි. සංවර්ධනය වෙමින් පවතින රටක් වන ශ්‍රී ලංකාව තුළ විවිධාකාර සංවර්ධන ව්‍යාපෘතීන් ක්‍රියාත්මක වේ. ජර්මානු තාක්ෂණික ආයතනය මගින් ක්‍රියාවට නැංවුණු "ප්‍රීමුස් ව්‍යාපෘතිය" එබඳු එක් සංවර්ධන ව්‍යාපෘතියකි. නාගරික පැල්පත් වාසී ප්‍රජා සංවර්ධනය උදෙසා සහභාගිත්ව සංවර්ධන ප්‍රවේශයේ යෝග්‍යතාව හඳුනා ගැනීම සඳහා ඉහත කී ව්‍යාපෘතිය ඇසුරෙන් සිදු කරන ලද අධ්‍යයනයක සොයාගැනීම් පාඨකයන් සමඟ බෙදා හදා ගැනීම මෙම ලිපියේ අරමුණ වේ. තව ද සහභාගිත්ව සංවර්ධනය පිළිබඳ සමාජ විද්‍යාත්මක විග්‍රහයක යෙදීම ද මෙම ලිපියේ තවත් අරමුණකි.

සහභාගිත්ව සංවර්ධනය පිළිබඳ සමාජ විද්‍යාත්මක විග්‍රහයකින් ඇරඹෙන මෙම ලිපිය ඉහත කී ප්‍රවේශය හරහා දිළිඳු ප්‍රජාව බලගැන්වීම පිළිබඳ මූලික අදහස් පෙළ ගස්වයි. සමාජය තුළ පුද්ගලයන් බලගැන්වීම සඳහාත්, මානව සංවර්ධනය සඳහාත් ප්‍රජා සහභාගිත්වය ඇති කිරීමට සහභාගිත්ව සංවර්ධනය ඉවහල් වන බව එම විග්‍රහයෙන් පැහැදිලි කරයි. ග්‍රාමීය නාගරික සංක්‍රමණය, නාගරීකරණය හා නාගරීකරණ වේගය වැඩිවීම ඇතුළු බොහෝ කරුණු මත සංවර්ධනය වෙමින් පවතින රටවල පැල්පත් ජනාවාස ඇති වන බව දෙවනු ව විග්‍රහ කෙරේ. තව ද රැකියා, නිවාස හා අධ්‍යාපන ඉඩ ප්‍රස්ථා නො ලැබී යාම හා සෞඛ්‍ය හා සමාජ ආරක්ෂණ වැඩපිළිවෙළක් නොමැති වීම යනාදී අංගවලින් යුත් බහුවිධ ප්‍රපංචයක් ලෙස නාගරික දිළිඳු බව පිළිබඳ අර්ථ විග්‍රහයක යෙදේ.

තෙවනු ව, කොළඹ නගරයේ පැල්පත් වාසී ජනාවාස ආශ්‍රිත ව ක්‍රියාත්මක වූ ප්‍රීමුස් නමැති ව්‍යාපෘතියේ කටයුතු සඳහා සහභාගිත්ව සංවර්ධන ප්‍රවේශයේ දායකත්වය කෙසේ ද යන්න විමසුමට ලක් කරයි. ඉන් හෙළිදරව් වන පරිදි අධ්‍යයනයට බඳුන් වූ ජනාවාස දෙකක දිළිඳු ප්‍රජාව කලක් තිස්සේ අපේක්ෂාවෙන් සිටි ඔවුන්ගේ මූලික අවශ්‍යතාවයන් හා බැඳුණු ගැටළු මඟහරවා ගෙන ඇති බව පැහැදිලි වේ. එබැවින් තිරසාර සංවර්ධනයක් සඳහා නාගරික සංවර්ධන ව්‍යාපෘතීන් හි දී සහභාගිත්ව සංවර්ධන ප්‍රවේශය ඉතා යෝග්‍ය වුව ද, දිළිඳු ප්‍රජාව තමන් එවැනි සංවර්ධන ප්‍රවේශයන් හි සැබෑ කොටස්කරුවන් බව ප්‍රමාණවත් අයුරින් අවබෝධ කරගෙන නොමැති බව පෙනේ.

## 1. හැඳින්වීම

සංවර්ධන කථිකාව තුළ සහභාගිත්ව සංවර්ධනයේ ඉතිහාසය ඉතා දීර්ඝ ගමනක ප්‍රතිඵලයකි (Bastion,1996). හැටේ දශකය අවසන් වන තුරු ම මෙම සංවර්ධන ව්‍යාපෘති අදාළ ප්‍රජාව වෙත ගොස් ඔවුන්ට අවශ්‍ය මොනවා ද යන්න පිළිබඳ පූර්ණ අධ්‍යයනයකින් තොර ව ක්‍රියාත්මක කරන ලද ඒවා විය. එය හුදෙක් ම ව්‍යාපෘතියක් මිස, සංවර්ධනය සඳහා වූවක් නො විය. එහි දී

ප්‍රජාවට භෞතික ව යමක් හිමිවීම මිස ඔවුන්ගේ පැවති මට්ටම වෙනස් කිරීම සඳහා ඉන් සක්‍රිය දායකත්වයක් සපයා නො තිබීම තුළ සහභාගිත්ව සංවර්ධන ප්‍රවේශයේ ඇති වැදගත්කම හැත්තෑව දශකය පමණ වන විට දැනෙන්නට විය.

හැත්තෑව දශකයේ දී මෙම තත්ත්වයෙ හි පැහැදිලි වෙනසක් සිදු වූ අතර, ප්‍රජාව හඳුනාගනිමින් වරණීය අවස්ථා ලබා දෙමින් භෞතික ව පමණක් නොව මානව සංවර්ධනයක් ද ඇති කිරීමට එමගින් උත්සාහ දරා තිබුණි (විග්නරාජා, 1990). මෙම බොහොමයක් ව්‍යාපෘති ක්‍රියාත්මක කෙරුණේ දැඩි ග්‍රාම්ය සන්දර්භයක් තුළ යි. පසුකාලීන ව ලංකාවේ ඇති වූ විවෘත ආර්ථික ප්‍රතිපත්ති ආදී දේශපාලනික තීරණයන් හමුවේ ක්‍රියාත්මක වූ තිරසර නාගරික සංකල්ප හරහා සහභාගිත්ව සංවර්ධනය නාගරික සංවර්ධන ව්‍යාපෘතීන් වෙත ද බලපාන ලදී.

රිල් ආයතනය විසින් 1998/99 වර්ෂවල දී සිදු කරන ලද පර්යේෂණයකට අනුව, (සෙවනත නාගරික සම්පත් මධ්‍යස්ථානය, 2001) කොළඹ නගරයේ අඩු පහසුකම් සහිත ජනාවාස 1506 ක් තිබූ බවට ගණන් බලා ඇත. ඉන් 74% ක ප්‍රතිශතයක් නිවාස වන අතර, 0.7% ක ප්‍රතිශතයක් ජනාවාස ය. මේ ආකාරයට නාගරික දිළිඳු ප්‍රජාවක් නිර්මාණය වීම සංවර්ධනය ඉදිරියේ පැහැදිලි අභියෝගයක් ව පවතී. ඊට මුහුණ සඳහා රාජ්‍ය සහ රාජ්‍ය නො වන මට්ටමේ ව්‍යාපෘති රැසක් ක්‍රියාත්මක වෙමින් පවතී. මෙම අංශ දෙකෙ හි ම ව්‍යාපෘතිවල මුල්කාලීන ප්‍රවණතා සහ ස්වරූපයන් පිළිබඳ ව අවධානය යොමු කිරීමේ දී රාජ්‍ය සුබසාධන වැඩසටහන් බොහොමයක් ඒ අතර ඇති බව පෙනේ. එහෙත් මෑතකාලීන ප්‍රවණතාවන් හි රාජ්‍ය සුබසාධන වැඩසටහන්වල ප්‍රතිශතය පහත බැස ඇති අතර, රාජ්‍ය නො වන සංවිධාන ඒ සඳහා ක්‍රියාත්මක වීමේ වැඩි නැඹුරුවක් දැකිය හැකි ය. ශ්‍රී ලංකාව තුළ දිළිඳු බව තුරන් කිරීම සඳහා ව්‍යාපෘති රැසක් ක්‍රියාත්මක කෙරුණ ද දිළිඳු බවේ රේඛාවෙන් පහළ සිටින ජනගහනයේ සංඛ්‍යාත්මක වර්ධනයක් මිස අඩු වීමක් ඉතා මෑතක් දක්වා දැකිය නො හැකි විය. මෙයට හොඳම නිදසුන වන්නේ, 1995 වසරේ සමෘද්ධිලාභීන්ගේ සංඛ්‍යාව මිලියන 1.2 ක් වූ අතර, 1999 වන විට එය මිලියන 2 දක්වා වර්ධනය වීම යි (ශ්‍රී ලංකා මහ බැංකුව, 2002).

හැත්තෑව දශකයේ ජනප්‍රියත්වයට පත් වූ ප්‍රජා සංවර්ධනය සහ ප්‍රජා සහභාගිත්වය වැනි සංකල්ප ද එක්සත් ජාතීන්ගේ සංවිධානයේ නිර්දේශ කිරීම් මත බොහෝ දියුණු රටවල සංවර්ධන ව්‍යාපෘතිවලට පවා ඇතුළු වෙමින් තිබේ. වැඩි වශයෙන් මේවා බලපෑමක් කිරීමට සමත් වූයේ 80 දශකයේ දී ය. ටර්නර්, (1976) පෙන්වා දී ඇති ආකාරයට සංවර්ධනය යනු, නව ඉදිකිරීම් සහිත භෞතික සංවර්ධනය නොවේ. නාගරික සංවර්ධනයේ දී සමාජ සංවර්ධනය ද සංවර්ධන වැඩපිළිවෙළේ අංගයක් විය යුතු බව ඔහුගේ අදහස යි. තමන්ගේ නිවාස සහ පොදු පහසුකම් තමන්ට අවශ්‍ය පරිදි ඉදි කරගනිමින්, රිසි සේ නඩත්තු කරගනිමින් ඉදිරියට යාමේ වගකීම දුප්පත් දුගී ජනයාට පවරා දී තිබීම මෙහි ලා සුවිශේෂ ය (ටර්නර්, 1976). ජර්මන් තාක්ෂණික සහයෝගිතා ආයතනයේ මූල්‍යමය දායකත්වයෙන් නාගරික සංවර්ධනය සඳහා සහභාගිත්ව සංවර්ධන ප්‍රවේශය භාවිතා කරමින්, "ප්‍රිමුස්" නමින් වූ ව්‍යාපෘතියක් මගින් නාගරික දිළිඳු බව අවම කිරීමේ උත්සාහයක් දරනු ලැබිණි. එම ප්‍රයත්නය මගින් සහභාගිත්ව සංවර්ධන ප්‍රවේශය පැල්පත්වාසී ප්‍රජා සංවර්ධනය සඳහා කෙතරම් දායකත්වයක් සපයා ඇත් ද යන්න මෙම ලිපිය මගින් විමසා බැලේ.

## 2. අධ්‍යයනයේ අරමුණු

මෙම අධ්‍යයනයේ මූලික ම අරමුණ වූයේ, සහභාගිත්ව සංවර්ධන ප්‍රවේශය නාගරික සංවර්ධනය කෙරෙහි කොතරම් දුරට යොදාගත හැකි ද යන්න සොයා බැලීම යි. ඒ සඳහා ජර්මන් තාක්ෂණික සහයෝගිතා ආයතනයත්, කොළඹ මහනගර සභාවත් එක්ව ක්‍රියාත්මක කෙරුණු "ප්‍රිමුස් ව්‍යාපෘතිය"

යටතේ සංවර්ධනය කෙරුණු වතු ජනාවාස දෙකක් අධ්‍යයනය සඳහා පාදක කර ගැනුණි. පෙසු අරමුණු අතර, සහභාගීත්ව සංවර්ධන ප්‍රවේශය යනු කුමක් ද? යන්න හා ඒ පිළිබඳ ව සමාජ විද්‍යාත්මක ව සොයා බැලීම විය. එමෙන් ම සහභාගීත්ව සංවර්ධන ප්‍රවේශය හඳුන්වා දීමට පෙර හා පසු ප්‍රජාවේ සමාජ ආර්ථික තත්ත්වය සොයා බැලීම කෙරෙහි ද මෙහි දී අවධානය යොමු විය.

## 3. අධ්‍යයන ක්‍රමවේදය

මෙම අධ්‍යයනය සඳහා ප්‍රාථමික හා ද්විතියික දත්ත භාවිතා කළ අතර, ප්‍රාථමික දත්ත ලබා ගැනීම සඳහා, සම්මුඛ සාකච්ඡා ක්‍රමය, ප්‍රත්‍යක්ෂ අධ්‍යයන, ප්‍රශ්නාවලියක් හා නිරීක්ෂණ ක්‍රමය යොදා ගැනිණි.

ද්විතියික දත්ත ලබා ගැනීමේ දී කොළඹ මහනගර සභාවේ දත්ත, ප්‍රිමූස් ක්‍රියාකාරී ව්‍යාපෘතියේ දත්ත හා කොළඹ නගරයේ ග්‍රාම නිලධාරී ලිපි ලේඛන හා සෞඛ්‍ය පරීක්ෂක වාර්තා යොදා ගැනිණි.

පර්යේෂණය සඳහා පාදක වූයේ, කොළඹ මහනගර සභා සීමාවට අයත් වූ අඩු ආදායම්ලාභී ප්‍රජාවක් ජීවත් වන තවම් මාවතේ පිහිටි "වැකන්ද සීය වත්ත" ජනාවාසය හා මරදාන විපුලසේන මාවතේ පිහිටි "25 වත්ත" ජනාවාස දෙක යි. ගුණාත්මක හා ප්‍රමාණාත්මක දත්ත භාවිතා කරමින් පර්යේෂණය සිදු කෙරුණු අතර, නියැදිය සඳහා මෙම ජනාවාස දෙකට ම අයත් සියළු ම පවුල් ඒකක යොදා ගැනිණි. එනම්, වැකන්ද සීය වත්තේ නිවාස 19 කුත්, විපුලසේන මාවත විසිපහ වත්තේ නිවාස 40 කුත් ය. මීට අමතර ව ප්‍රිමූස් ව්‍යාපෘති නිලධාරීන් දෙදෙනකු සහ කොළඹ මහනගර සභාවට අයත් නිලධාරීන් තිදෙනකු සමඟ පැවැත් වූ සම්මුඛ සාකච්ඡා මඟින් ද දත්ත ලබා ගැනිණි.

මෙම ලිපිය කොටස් තුනකින් සමන්විත වන අතර, පළමු කොටසින්, සහභාගීත්ව සංවර්ධන ප්‍රවේශය හා එය දිළිඳු ප්‍රජාව බලගැන්වීම සඳහා උපයෝගී කරගන්නා ආකාරය පිළිබඳ ව සාකච්ඡා කෙරේ. දෙවන කොටසින්, ශ්‍රී ලංකාවේ හා කොළඹ නගරයේ දිළිඳු බවේ ලක්ෂණ පිළිබඳවත්, තෙවන කොටසින්, අධ්‍යයනයට ලක් කළ ප්‍රිමූස් ව්‍යාපෘතිය පිළිබඳවත් සාකච්ඡා කෙරේ.

## පළමු කොටස

## සහභාගිත්ව සංවර්ධන ප්‍රවේශය තුළින් දිළිඳු ප්‍රජාව බලගැන්වීම

හැත්තෑව දශකයේ මැද භාගයෙන් පසුව සංවර්ධන විෂය ක්ෂේත්‍රයේ සිදුවූ අධ්‍යයන රසක විෂය පථය වූයේ "සහභාගිත්වය" යන්න යි. වචනාර්ථයෙන් ගත් කළ "සහභාගිත්වය" යන්න ඕනෑම ප්‍රජා වැඩසටහනක් සඳහා භාවිතා කළ හැකි ක්‍රමෝපායකි. එහෙත් "සහභාගිත්ව සංවර්ධනය" යන සංකල්පය මඟින් වැඩිපුර ම අවධාරණය වන්නේ, දිළිඳු ජනතාවගේ සංවර්ධනය යි. මේ අනුව සහභාගිත්ව, සංවර්ධන ප්‍රවේශය තුළ කිසියම් ඉලක්ක ප්‍රජාවක් අන්තර්ගත වන බව පෙනේ. බෙන්ජමින් බැගෝඩියන් සහභාගිත්ව සංවර්ධනය අර්ථනිරූපණය කරනුයේ කිසියම් ව්‍යාපෘතියක් සැලසුම් කිරීම, කළමනාකරණය කිරීම, ගොඩනැඟීම යන අවස්ථාවල දී වගකීම හා කාර්යයන් අර්ථවත් පරිදි බෙදා ගැනීමක් ලෙසට යි (අබේරත්න, 1997). එය ග්‍රාමීය මට්ටමේ දී තිරසර සංවර්ධනය අරමුණු කරගත් නව ආර්ථික බලවේගයක් බව වොජරා,(1990) පෙන්වා දේ.

ප්‍රජා සහභාගිත්වය ලබා ගැනීම පිළිබඳ ව මූලික අදහස් 4 කි.

1. ප්‍රජාවගේ ජීවිතයට බලපාන කරුණුවල දී විශේෂයෙන් ම සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා කළමනාකරණයේ දී ඔවුන්ට අයිතියක් ඇති අතර, එය ඔවුන්ගේ රාජකාරිය ද වනු ඇත.

2. සහභාගිත්වය ව්‍යාපෘතියක ප්‍රතිඵල සාර්ථක කරන ක්‍රමයකි. ඔවුන් සතු ශිල්පීය හැකියාවන් සහ මෙතෙක් භාවිතා නො කළ සම්පත් භාවිතය ආශ්‍රයෙන් ප්‍රජාව ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට සහාය වේ. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට දක්වන සහාය නිසා ඔවුන්ගේ අවශ්‍යතා සහ මූලිකත්වය දිය යුතු අංශ ව්‍යාපෘති ප්‍රතිඵල තුළින් දෘශ්‍යමාන වේ.

3. සහභාගිත්වය තුළ ස්වයං සහභාගිත්ව කැමැත්ත ක්‍රියාත්මක වන අතර, එමඟින් ප්‍රජාවට ලෝකය පුළුල් ව දැකිය හැක.

4. ස්වශක්තිය, එකමුතුකම ආදී ගුණාංග සහභාගිත්වය හරහා වර්ධනය කරන අතර, එතුළ ඇති ඉගෙනීමේ ක්‍රියාදාමය විසින් ප්‍රජාවේ ප්‍රශ්න හඳුනාගැනීමට සහ ඒවා විසඳා ගැනීමේ ක්‍රියාවලියට අවතීර්ණ වීමට සුදුසු පුද්ගලයින් බවට ද පත් කරනු ලැබේ.

මේ අනුව පැහැදිලි වනුයේ, සමාජය තුළ පුද්ගලයින් සවිබල ගැන්වීම හා මානව සංවර්ධනය සඳහා ප්‍රජා සහභාගිත්වය ඇති කිරීමට සහභාගිත්ව සංවර්ධනය ඉවහල් වන බව යි. කෙසේ වූව ද ප්‍රජාව තුළ සංවර්ධනයක් ඇති කිරීම මඟින් දිළිඳු බව අවම කිරීමට කටයුතු කිරීම මෙම සංවර්ධන ව්‍යාපෘතිවල මුඛ්‍ය පරමාර්ථය වේ. එනම්, ග්‍රාමීය සහ නාගරික දිළිඳු ප්‍රජාව ශක්තිමත් කිරීමේ අරමුණින් සංවර්ධනයට නැඹුරු වූ රාජ්‍ය නො වන සංවිධාන පිහිටුවා ගෙන ඇත. දිළිඳු ජනයාගේ නිර්ව්‍යාජ සිතුම්පැතුම් අවදි කරලීම, ඔවුනට අවශ්‍ය තොරතුරු ලබා ගැනීමේ මං පාදා දීම, දැනුවත්භාවය ඇති කිරීම, දිළිඳු ජනයා තුළ සැඟවුණු නිර්මාණශීලීත්වය අවදි කරලීම, දිළිඳු ප්‍රජාව අතර ආයතන ගොඩනැංවීම වැනි ක්‍රමවේදයන් තුළින් ග්‍රාමීය හා නාගරික ජන කොටස් ශක්තිමත් කිරීම එම සංවිධානයන්ගේ අරමුණ වේ. සමාජ විද්‍යාත්මක දෘෂ්ටියෙන් දරිද්‍රතාවය පිළිබඳ විග්‍රහ කරන සමාජ විද්‍යාඥයින් ශ්‍රී ලංකාවේ සංවර්ධන ව්‍යාපෘතිවල අසාර්ථකභාවය පිළිබඳ ව පොදුවේ ඉදිරිපත් කරන අදහස් කීපයකි. එනම්, මෙම ව්‍යාපෘතීන් සාර්ව මට්ටමින් ඉදිරිපත් කිරීම, ද්‍රව්‍යාත්මක නො වන තත්ත්වයන් පිළිබඳ පමණක් අවධානය යොමු කිරීම, සම ජාතීන් සියල්ලක් ම දිළිඳු ජනයා ලෙස සැලකීම සහ දේශපාලන අවශ්‍යතා මත ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම යනාදිය යි (ඒකනායක, 2004).

කෙසේ වෙතත්, ප්‍රජාව තුළ ක්‍රියාත්මක සහභාගිත්ව සංවර්ධනයේ දී බලගැන්වීමේ න්‍යාය උපයෝගී කරගනු ලබන බව පෙනේ. එනම්, මෙම න්‍යායයත් හරහා පෙන්වා දෙන්නට උත්සාහ ගනුයේ, මිනිසුන් දිළිඳුභාවයට පත්ව ඇත්තේ සම්පත් නොමැතිකම නිසා ම නොව, අධ්‍යාත්මික සංවර්ධනයක් සිදු වී නොමැති නිසා බව යි. සමාජ සංවර්ධන ව්‍යාපෘති සඳහා මෙම "සවිබලකරණය" හෙවත් ජනතාව බලගැන්වීම ප්‍රධාන න්‍යායක් ලෙස භාවිතා කෙරේ. මෙම න්‍යායේ සංවර්ධනය සඳහා රොබර්ට් චේම්බර්, නෝමන් අප්හොෆ්, ඩේවිඩ් ලීමන් සහ වෝල්ටර් ක්වාඩ් තම අධ්‍යයනයන් මඟින් දායකත්වය සපයා තිබේ. රොබට් චේම්බර් "බලසතුකරණ න්‍යාය" ඔස්සේ අවධානය යොමු කරනුයේ, සහභාගිත්ව සංවර්ධනය ක්‍රියාත්මක වීම පිළිබඳ ව ය. චේම්බර්, (1995) ට අනුව, සවිබලකරණ න්‍යාය ප්‍රධාන කොටස් දෙකකි. එනම්, සහභාගිත්ව සංවර්ධනය (participatory development) සහ සමාජ සජීවිකරණය (social mobilization) යි. ඔහු පවසනුයේ සහභාගිත්ව එළඹුම තුළ ප්‍රජාවන් බලසතුකරණය වන අතර, බාහිර ආයතන, පුද්ගලයින් හා උගතුන් සමඟ සබඳතාවන් ඇති කරගැනීමේ අවස්ථාව අඩු ආදායම්ලාභී ප්‍රජාවට ඇති කරගත හැකි බව යි (චේම්බර්, 1995). එසේ ම මෙම න්‍යාය තිරසර මානව සම්පත් සංවර්ධනය තුළ ද වර්තමාන සංවර්ධනවේදීහු යොදා ගනිති. චේම්බර්, (1995) පැහැදිලි ව පෙන්වා දෙනුයේ, ජනතාවගෙන් ඉගෙන ගැනීම, ජනතාව සමග වැඩ කිරීම සහ ජනතාව සමග සැලසුම් කිරීම ද මේ සඳහා අත්‍යාවශ්‍ය බව යි. සවිබල ගැන්වීමේ න්‍යායවේදීන්ට අනුව, ප්‍රජාවක අවදානම්භාවය ඇතිවීම සඳහා සම්පත් නොමැති වීම ද බලපායි. එමඟින් දිළිඳු බවට පත්වීම සහ හුදකලා වීමත්, ඒ නිසා ම බල රහිත කණ්ඩායමක් බවට පත්වීමත් සිදුවන බව බලසතුකරණ න්‍යායවේදීහු පෙන්වා දෙති.

## තිරසර නාගරික සංවර්ධනයක් උදෙසා සහභාගිත්ව සංවර්ධන ප්‍රවේශය


නාගරික දිළිඳුකම අවම කිරීම තිරසර නාගරික සංවර්ධන ගැටලු අතර සපුරා ගත යුතු මට්ටමේ වන මූලික ඉලක්කයකි. බොහෝ ව්‍යාපෘති නාගරික දිළිඳුකම ඉලක්ක කරගනිමින් ක්‍රියාවට නැංවීමට උත්සාහ ගත්ත ද ඒවා ක්‍රියාත්මක වන වපසරිය හා එහි ව්‍යාකූලතා එම ව්‍යාපෘතිවල අසාර්ථකත්වයට දැඩි ව බලපා තිබේ. කෙසේ වෙතත් ලංකාව තුළ ක්‍රියාත්මක වන ව්‍යාපෘතිවලට හුදෙක් ම සුබසාධන ස්වරූපයෙන් ගැලවී යාමට හැකි වී නොමැත. එම ව්‍යාපෘති ප්‍රායෝගීකරණයේ දී තවදුරටත් ගැටලුසහගත තත්ත්වයක් ඇති කරලීමට බලපා ඇත. කෙසේ වුව ද වඩා පැහැදිලි සංවර්ධන ප්‍රතිඵල ඇති කරලීමට නම්, අදාළ පාර්ශ්වයන් එනම්, "සේවාලාභියා යැපෙන්නකු නොව, ස්වාධීන ව ජීවත්වීමට හැකි අයෙක්" ය යන හැඟීම ඇති කළ යුතු ය. ඒ තුළ හුදු යැපීමේ මානසික මට්ටමක් නො පවතී.

කෙසේ වුවත්, කොළඹ නගරය ආශ්‍රිත ව ඇති කළ ව්‍යාපෘතීන් හි දී නිසි උපායමාර්ගික රාමුවලට අනුකූල ව පිඹුරුපත් සකස් කර නොමැති බව පැහැදිලි වේ. එනම්, මේවා හි නිසි ආයතනික රාමුවක් නැත. ඒවා සකස් කිරීමේ දී පුළුල් මහජන සහභාගිත්වයක් හෝ අදහස් ලබා ගැනීමක් සිදු වී නොමැත. ධූරාවලියේ ඉහළ නිල බල ව්‍යුහයන් හරහා පමණක් එකඟතා ක්‍රියාත්මක වීම් තුළ පහළ පාර්ශ්වයන් නියෝජනයකට සාධාරණත්වයක් ඉටු කිරීම අවප්‍රමාණික වී ඇත. මේ හේතුවෙන් මෙම සංවර්ධන ව්‍යාපෘතීන් හි දී ක්‍රියාත්මක තලය වඩා උචිත වනුයේ, සහභාගිත්ව සංවර්ධනයක් මඟින් ප්‍රායෝගික තලයකට පිවිසීම හරහා ය.

සහභාගිත්ව සංවර්ධන ප්‍රවේශය හරහා සංවර්ධන ක්‍රියාවලියට නාගරික දිළිඳු ප්‍රජාව සහභාගී කරවා ගැනීමෙන් මූලික ව ම අපේක්ෂිත කරුණක් වන්නේ, දරිද්‍රතා චක්‍රය බිඳ දැමීම යි. ඒ හරහා ප්‍රජාව බලගන්වා වඩා ඵලදායී සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කොට නිසි ප්‍රතිඵල ලබා ගත හැක.

රූපසටහන අංක 1

**දරිද්‍රතා චක්‍රය**




මෙම චක්‍රයට අනුව, දිළිඳු ප්‍රජාව වෙත බලය පැවරුව හොත් ඔවුන් තුළ අසරණකම වෙනුවට වගකීමක් හා බලය සහිත තත්ත්වයක් ජනිත වේ. කිසිදු දිනක ඔවුන් තනිවත්තේ නැත. බලය ක්‍රියාත්මක කිරීමට පිරිසක් සිටීම මත බලය හරහා පුද්ගල සම්බන්ධතා ගොඩ නැගේ. මේ නිසා තනිවීම හේතුවෙන් ශාරීරික දුර්වලතා ඇති නොවේ. මෙහි දී බල සහිත කණ්ඩායමක් හරහා පුද්ගලයා සංවර්ධනයේ මූලික ප්‍රවාහයේ පෙරගමන්කරුවකු මෙන් ම කොටස්කරුවකු බවට ද පත් වේ. මේ තුළින් තිරසාර නාගරික සංවර්ධනයක් සාක්ෂාත් කරගත හැකි අතර, සහභාගිත්ව ප්‍රවේශය හරහා වගකීම් බෙදී යාමත්, ජනතාව බල ගැන්වීමත් මඟින් සමාජ කටයුතු කෙරෙහි වන නැඹුරුව වර්ධනය වීම තුළින් සංවර්ධනය වඩා ඵලදායී කරගත හැකි වනු ඇත.

## දෙවැනි කොටස

### සංවර්ධනය වෙමින් පවතින රටවල පැල්පත් ජනාවාස ඇති වීමට හේතු

සංවර්ධිත රටවල මෙන් ම සංවර්ධනය වෙමින් පවතින රටවල ද අනවසර පැල්පත් ජනාවාස දක්නට ලැබේ. එහෙත් සංවර්ධිත කලාපයට සාපේක්ෂ ව සංවර්ධනය වෙමින් පවතින කලාපයේ පැල්පත් ජනාවාසවල පැතිරීම වැඩි බව දක්නට ලැබේ. සංවර්ධනය වෙමින් පවතින රටවල සැලසුමකින් තොර ව සිදුවන ග්‍රාමීය නාගරික සංක්‍රමණය, නාගරීකරණය සහ නාගරීකරණ වේගය වැඩිවීම, නාගරීකරණයට සාපේක්ෂ ව ආර්ථිකය වර්ධනය නො වීම සහ ඒ නිසා ම නව රැකියා අවස්ථා ජනිත නො වීම, සංවර්ධනය වෙමින් පවතින රටවල ජන සංඛ්‍යාවෙන් වැඩි ප්‍රමාණයක් මූලික අවශ්‍යතාවයන්වත් සපුරා ගත නො හැකි මට්ටමේ සිටීම, ජන සංඛ්‍යා වර්ධන වේගය වැඩිවීම, යැපුම් අනුපාත ඉහළ මට්ටමක පැවතීම යන කරුණු සංවර්ධනය වෙමින් පවතින රටවල අනවසර ජනාවාස බිහි වීමේ විෂමතාවය සාපේක්ෂ ව වැඩිකිරීමට හේතු වී තිබේ.

වගු අංක 1

ලෝකයේ ඇස්තමේන්තු මුඩුක්කු පැල්පත් ජන සංඛ්‍යාව - (2003)

| ලෝකයේ ප්‍රදේශ/කලාපය | මුළු ජන සංඛ්‍යාව (මිලියන) | නාගරික ජන සංඛ්‍යාව | | නාගරික අඩු පහසුකම් සහිත ජන සංඛ්‍යාව | |
|---|---|---|---|---|---|
| | | මිලියන | මුළු ජන සංඛ්‍යාව %ක් ලෙස | දහස් | නාගරික ජන සංඛ්‍යාව %ක් ලෙස |
| ලෝකය6134 | 2923 | 47.7 | 923986 | 31.6 | |
| සංවර්ධිත කලාපය | 1194 | 902 | 75.5 | 54068 | 6.0 |
| යුරෝපය | 726 | 534 | 73.6 | 33062 | 6.2 |
| යුරෝපය හැර | 467 | 367 | 78.6 | 21006 | 5.7 |
| සංවර්ධිත වෙමින් පවතින කලාපය | 4940 | 2022 | 40.9 | 869918 | 43.0 |
| උතුරු අප්‍රිකාව | 146 | 76 | 52.0 | 21355 | 28.2 |
| උප සහරා අප්‍රිකා | 667 | 231 | 34.6 | 166208 | 71.9 |
| ලතින් ඇමරිකාව සහ කැරිබියන් | 527 | 399 | 75.8 | 127567 | 31.9 |
| නැගෙනහිර ආසියාව | 1364 | 533 | 39.1 | 193824 | 36.4 |
| දකුණු හා මධ්‍යම ආසියාව | 1507 | 452 | 30.0 | 262354 | 58.8 |
| ගිනිකොණ දිග ආසියාව | 530 | 203 | 38.3 | 56781 | 28.0 |
| බටහිර ආසියාව | 192 | 125 | 64.9 | 41331 | 33.1 |
| ඕෂනියාව | 8 | 2 | 20.2 | 499 | 24.1 |

මූලාශ්‍රය: United Nation, (2003).

වගු අංක 1 ට අනුව, අප්‍රිකානු උප සහරා කලාපයේ නාගරික ජන සංඛ්‍යාවෙන් 72% ක් ද, දකුණු සහ මධ්‍යම ආසියාවේ නාගරික ජන සංඛ්‍යාවෙන් 59% ක් ද, නාගරික අඩු පහසුකම් සහිත ජනාවාසවල ජීවත් වෙති. දකුණු හා මධ්‍යම ආසියාවේ මෙම අගය ඉහළ යාමට ඉන්දියාවේ හා

බංගලාදේශයේ අධික ලෙස පැතිරී ඇති අඩු පහසුකම් සහිත නාගරික ජනාවාස විශාල දායකත්වයක් සපයා ඇත.

ඉහත කී පරිදි සංවර්ධනය වෙමින් පවතින රටවල පැල්පත් හා මුඩුක්කු ඇතිවීමට ප්‍රධාන ම හේතුව ලෙස එක්සත් ජාතීන්ගේ සංවිධානය දක්වා ඇත්තේ, ග්‍රාමීය නාගරික සංක්‍රමණය යි. Everettes. Lee ගේ සංක්‍රමණය න්‍යායට (Robin, 1996) අනුව ග්‍රාමීය නාගරික සංක්‍රමණයේ දී,

(අ) ගමනාරම්භය හා බැඳුණු සාධක

(ආ) ගමනාන්තය හා බැඳුණු සාධක සහ

(ඇ) අතරමැදි බාධක හා පෞද්ගලික සාධක යන කරුණු බලපානු ලැබේ.

ඔහු දක්වන ආකාරයට ධනාත්මක, ඍණාත්මක හා නිශ්ක්‍රීය සාධක ගමනාරම්භයේ මෙන් ම ගමනාන්තයේ ද තිබේ. නමුත් ගමනාන්තයේ පවතින ඍණාත්මක සාධකවලට වඩා ගමනාරම්භයේ ඇති ඍණාත්මක සාධක වැඩි නම් එය සංක්‍රමණය සඳහා මිනිසුන් පොළඹවයි. නාගරික ප්‍රදේශවල පවතින ඍණාත්මක සාධකවලට වඩා ග්‍රාමීය ප්‍රදේශවල පවතින ඍණාත්මක සාධක වැඩි නම්, නැත හොත් ග්‍රාමීය ප්‍රදේශවල පවතින ධනාත්මක සාධකවලට වඩා නාගරික ප්‍රදේශවල පවතින ධනාත්මක සාධක වැඩි නම්, ග්‍රාමීය ප්‍රදේශවලින් නාගරික ප්‍රදේශ කරා සංක්‍රමණය සිදු වේ (Robin, 1996). නාගරීකරණය සඳහා නාගරික සංක්‍රමණයට අමතර ව ජන සංඛ්‍යාවේ පළමු හා දෙවන පරම්පරාවෙන් බිහි වන පුද්ගලයින් ද සැලකිය යුතු දායකත්වයක් සපයයි. ලෝක ජන සංඛ්‍යා වර්ධනයෙන් 90% ක් සංවර්ධනය වෙමින් පවතින රටවල් ආශ්‍රිත ව වන අතර, එයින් 70% ක් නාගරික ප්‍රදේශ ආශ්‍රිත ව සිදු වේ. එම 70% න් 50% ක් පමණ ම පැල්පත් හා මුඩුක්කු ආශ්‍රිත ව වර්ධනය වී තිබේ. මෙහි දී පැල්පත් ජනාවාස හා නාගරීකරණය එකිනෙකින් ව්‍යුක්ත කළ නො හැක්කක් බව පැහැදිලි වේ.

## ශ්‍රී ලංකාවේ නාගරික දිළිඳු බව

"නාගරික දිළිඳු බව" යන සංකල්පය පිළිබඳ ව අවධානය යොමු කිරීමේ දී ඒ සඳහා පැහැදිලි නිර්වචනයක් ඉදිරිපත් කිරීම අපහසු ය. විවිධ සංවර්ධන මැදිහත්කරුවන් සහ විද්වතුන් එය විවිධාකාරයෙන් නිර්වචනය කොට ඇත. වඩා පැහැදිලි නිර්වචනයක් හෝ අර්ථකථනයක් ඒ සම්බන්ධයෙන් ඉදිරිපත් කළ නො හැක්කේ එහි පවතින ගතික බව හේතුවෙනි. ඒ නිර්වචනය කිරීම රටින් රටට, කලාපයෙන් කලාපයට සහ ප්‍රදේශයෙන් ප්‍රදේශයට වෙනස් වේ. නාගරික දිළිඳු බව බහුවිධ ප්‍රපංචයකි. සාමාන්‍ය දුප්පත්කමට වඩා ඔවුන් පෙළෙනුයේ විභින්නතාවයෙනි. උදාහරණ ලෙස, ප්‍රමාණවත් රැකියාවක් නො ලැබීම, නිවාස සහ සේවාවන් නොමැති වීම, අධ්‍යාපන ඉඩ ප්‍රස්ථා නො ලැබී යාම, සෞඛ්‍යය සහ සමාජ ආරක්ෂණ වැඩපිළිවෙළක් නොමැති වීම යනාදිය යි.

විවිධ වූ විෂම වූ සමාජ ප්‍රශ්නවලින් නාගරික ප්‍රජාව පෙළෙති. පවුලේ පවතින අස්ථාවරභාවය, මූලික සේවා පහසුකම් නොමැති වීම, සමාජ අපරාධ, ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය, මත්කුඩු, මත් ද්‍රව්‍ය භාවිතය හේතුවෙන් ඇතිවන විවිධ සමාජයීය ප්‍රශ්න ඔවුන් දිළිඳු බවට තල්ලු කරන සාධක අතර මුල්තැන ගෙන තිබේ. නාගරික ප්‍රජාවගෙන් වැඩිදෙනකුට අත්‍යවශ්‍ය මූලික පහසුකම් වන පානීය ජලය, සනීපාරක්ෂක කටයුතු සඳහා වැසිකිළි, අපවිත්‍ර ජලය බැස යාමට ක්‍රමවත් කාණු පද්ධති, විදුලිය පහසුකම් සහ වෙනත් පොදු පහසුකම්වල ද විශාල ඌණතාවයක් පවතී. මෙය වඩාත් උග්‍ර වන්නේ අධික තදබදයකින් යුත් ජනාවාසවල ඔවුන් කොටු වී සිටින වටපිටාවක් තුළ ය (සෙවනත නාගරික සම්පත් මධ්‍යස්ථානය, 2002). වර්තමානයේ නාගරික දිළිඳු ප්‍රජාවගේ දිළිඳුකම අවම කිරීම සඳහා ඇති එක් ප්‍රධානතම බාධකයක් වනුයේ, ඔවුන් පදිංචි නිවසට හෝ

ඉඩමට අයිතියක් නොමැති වීම යි. නාගරික දිළිඳුබව වර්ධනය වීම සඳහා ශ්‍රී ලංකාව වැනි සංවර්ධනය වෙමින් පවතින තෙවන ලෝකයේ රටවල පවතින සීරු මාරු රාජ්‍ය ප්‍රතිපත්තීන් ද හේතු වේ. බලයට පැමිණෙන කවර ආණ්ඩු පාර්ශ්වයක් වුව ද රාජ්‍ය සුබසාධන කටයුතු කප්පාදු කිරීම ඊට හේතුව යි. නාගරික පරිභෝජනවාදය කේන්ද්‍ර කරගනිමින් නිෂ්පාදනය ව්‍යාප්ත වීමත්, කේන්ද්‍රය බලවත් වීම මත රැකියාමය අවස්ථා සහ පහසුකම් හරහා පුද්ගලයින් ඊට ආකර්ශනය වීමත් නිසා තවදුරටත් නගර කේන්ද්‍රීය පරිභෝජන රටාවක් ඇති වී තිබේ.

වර්ෂ 1998/1999 කාලවකවානුවේ දී රීල් සමාගම විසින් සිදු කරනු ලැබූ සමීක්ෂණයකට අනුව, කොළඹ නගරය තුළ අඩු පහසුකම් සහිත ජනාවාස 1506 ක් තිබෙන බවට ගණන් බලා ඇත. මෙම ජනාවාස බොහොමයක් පවතින නිවාස ප්‍රමාණය අනුව කුඩා ජනාවාස වේ. ඒ අනුව ඉහත සඳහන් ජනාවාසවලින් 74% ක පමණ නිවාස සංඛ්‍යාව 50 හෝ ඊට අඩු අගයක් ගන්නා අතර, නිවාස 500 කට වඩා වැඩි ජනාවාස තිබෙනුයේ නගරයේ ජනාවාස ප්‍රමාණයෙන් 0.7% ක පමණි. කොළඹ නගරයේ අවිධිමත් අංශයේ රැකියාවන් හි මෙන් ම නුපුහුණු කම්කරු සේවයෙ හි නියුතු වැඩි ප්‍රමාණයක් මෙම නාගරික අඩු පහසුකම් සහිත ජනාවාස විශේෂයෙන් ම මුඩුක්කු, කම්කරු නිවාස, පේළි නිවාස සහ අනවසර පැල්පත්වල වාසය කරති.

දිනෙන් දින වර්ධනය වන අඩු ආදායම්ලාභී ජනාවාස සංඛ්‍යාවට සාපේක්ෂ ව වර්ධනය වන අවිධිමත් අංශයේ රැකියා රටාව හේතුවෙන් ආර්ථිකයේ අස්ථාවර තත්ත්වයක් ද උද්ගත වී තිබේ. එමෙන් ම දිනෙන් දින වර්ධනය වන නාගරික ජනගහනය තුළ අවිධිමත් අංශයේ රැකියා හරහා අමතර ආදායම් මාර්ග උපයා ගැනීමේ අවස්ථා උදා වී තිබේ. මේ තුළින් පැහැදිලි වනුයේ, බහුතරයක් වූ අනිවාර්ය දුප්පතුන් පිරිසක් නාගරික සීමාව තුළ ජීවත්වන බව යි. ඔවුන්ගේ ව්‍යාප්තිය නාගරික සංවර්ධනය කෙරෙහි නිරන්තර බාධා එල්ල කරන්නකි. නගරය තුළ දුප්පත් මෙන් ම පොහොසත් වශයෙන් වන බෙදීම හේතු කොටගෙන ඇතිනැති වශයෙන් විශාල පරතරයක් නිර්මාණය වී ඇත. එම පරතරය පුළුල් වෙත් ම නාගරික සංවර්ධනයට ප්‍රබල පහරක් එල්ල කර තිබේ. නගරය තුළ බහුතරය දිළිඳු ප්‍රජාව වීම හේතුවෙන් සංවර්ධනය සම්බන්ධයෙන් ඔවුන් වෙත අවධානය යොමු කිරීමේ දී සංවර්ධනය යන්නට තාවකාලික විරාමයක් තැබීමට සිදුවීම තෙවැනි ලෝකයේ සංවර්ධනය වෙමින් පවතින රටවලට මුහුණපෑමට සිදු ව ඇති බරපතල ගැටලුවකි.

## කොළඹ නගරයේ පවතින දුගීබවේ සුවිශේෂී ලක්ෂණ

කොළඹ නගරය මෙරට සිටි විදේශීය පාලකයින්ගේ අවශ්‍යතා අනුව සැලසුම් කරන ලද නගරයක් ලෙස හැඳින්විය හැක. ඔවුන්ගේ ප්‍රධානතම ආදායම් මාර්ගය වූයේ වෙළෙඳාම යි. ඊට පහසු වන ආකාරයට නිර්මාණය කරන ලද වෙළෙඳ පරිපාලන මධ්‍යස්ථානය වනුයේ, කොළඹ නගරය යි. වසර 500 ක පමණ කාලයක සිට වෙනස් වන කොළඹ නගරයේ සංවර්ධනය නිශ්චිත සැලැස්මකට අනුව සිදු වී නොමැති බව කොළඹ නගරය පිළිබඳ ව ලියැවුණු ඓතිහාසික තොරතුරුවලට අනුව පැහැදිලි වේ. කොළඹ නගරය සැලසුම්සහගත ලෙස සංවර්ධනය කිරීම සඳහා සංවර්ධන සැලසුම් දෙකක් නගර නිර්මාණ ශිල්පීන් විසින් ඉදිරිපත් කරනු ලැබුව ද සැලසුම්වල ඇතුළත් සමහර යෝජනා පමණක් ක්‍රියාත්මක කර ඇති අතර, නගරයේ විශාල කොටසක් එකී සැලසුම්වලට පටහැනි ව සංවර්ධනය කර ඇති බව පෙනී යයි (සෙවනත නාගරික සම්පත් මධ්‍යස්ථානය, 2002).

කොළඹ නගරයේ භූමි ප්‍රමාණය ඉතා කුඩා ය. එය වර්ග කිලෝමීටර් 37.32 කි. නගරය තුළ දැනට හය ලක්ෂ හතළිස් දෙදහසක පමණ වූ ජනගහනයක් ජීවත් වන අතර, දිනපතා ම නගරයට පිටතින් පැමිණෙන ජනගහනය හාර ලක්ෂයක් පමණ වෙතැ යි ගණන් බලා ඇත. කොළඹ නගරයේ හෙක්ටයාරයකට පුද්ගලයින් 172 ක් වන පරිදි අධික ජන ඝනත්වයක් පවතී. ඉඩම් මිල අධික වීම සහ සංවර්ධනය සඳහා ඉතිරි ව ඇති ඉඩ ප්‍රමාණය ක්‍රමයෙන් අඩුවීම

කොළඹ නගරයේ ජීවත් වන මධ්‍යම පාන්තික ජනතාව තම ඉඩකඩම් ඉහළ මිලකට අලෙවි කර උප නගර කරා සංක්‍රමණය වීමට හේතු වී ඇත (සෙවනත නාගරික සම්පත් මධ්‍යස්ථානය, 2001). මේ හේතුවෙන් ඉඩම් මිල අධික බව මත එහි රැඳී සිටින අනවසර පදිංචිකරුවන් තවදුරටත් එම ඉඩම්වලින් ඈත් කරලීම අපහසු කර ඇත. එය ඔවුන්ගේ ජීවිතයට උදාකර ඇත්තේ අවදානම්සහිත තත්ත්වයකි. එසේ ම ඉඩම් කුඩා වීම මත තවදුරටත් අඩු ආදායම්ලාභී ප්‍රජාවට අවශ්‍ය භූමි ප්‍රමාණයේ ද හිඟයක් පවතී. මෙය සංවර්ධනයට දිගුකාලීන මෙන් ම සෘජු හා වක්‍ර බලපෑම් ද එල්ල කරයි.

මේ ආකාරයට ජනගහනය කොළඹ දිස්ත්‍රික්කය තුළ වසරින් වසර ක්‍රමයෙන් ඉහළ යාමක් පෙන්නුම් කෙරේ. 2001 ජන හා නිවාස සංගණන වාර්තාවට අනුව, කොළඹ නගරයේ මුළු ජනගහනය වාර්තා වූයේ, 647,020 ක් ලෙස ය. ඉන් අනතුරු ව දිවයිනේ වැඩි ම ජන සංඛ්‍යාවක් වාර්තා වූයේ, දෙහිවල, ගල්කිස්ස මහනගර සභාවෙනි. එය සංඛ්‍යාත්මක ව 209,787 ක් විය (ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, 2004). දිවයිනේ ප්‍රධාන පරිපාලන හා මූල්‍ය ආයතන රාශියක ප්‍රධාන කාර්යාලයන් කොළඹ නගරය තුළ පිහිටීමත්, ප්‍රධාන පාසල් මෙන් ම විවිධ අංශයේ රැකියා අවස්ථාවන් තිබීමත් හේතුවෙන් සෙසු ප්‍රදේශයන් හි ජනතාව කොළඹ නගරය කරා ඇදී ඒමට හේතු වී ඇත. 20 වන සියවස මුල දී මෙය කැපී පෙනුණි. මෙවැනි සාධකයන්ගේ බලපෑම් මත කොළඹ නගරය කාර්යමය, නේවාසික, ජනවාර්ගික මෙන් ම පන්ති විෂමතාවයන්ගෙන් ද අනෙකුත් නගර අභිබවා සිටී. 1881-2001 දක්වා ගත වූ වසර 120 ක කාලය තුළ නගරයේ ජන සංඛ්‍යාව සීඝ්‍රයෙන් වර්ධනය වීම හේතුවෙන් කොළඹ නගරය තුළ දැඩි ජන ඝනත්වයක් වාර්තා විය. මෙය කොළඹ අවට උපනගර බිහිවීම දක්වා වර්ධිත තත්ත්වයකට පාදක වී තිබේ.

කොළඹ නගරය සඳහා වූ සංවර්ධන සැලැස්මට අනුව, (සෙවනත නාගරික සම්පත් මධ්‍යස්ථානය, 2002) කොළඹ නගරයේ නීත්‍යානුකූල නො වන මට්ටමින් ඉදි කළ පැල්පත් සහ මුඩුක්කු 1,509 කට ආසන්න සංඛ්‍යාවක් පවතින්නේ රජයේ ඉඩම්වල බව සඳහන් කරයි. මෙය ශ්‍රී ලංකාවේ නාගරික දිළිඳු ජනගහනයෙන් 20% කි. මොවුන්ගේ සාක්ෂරතාවය ඉතා පහළ මට්ටමක පවතී. එහෙත් වර්තමානය වන විට තහවුරු නොවූ කාරණා කීපයක් වේ. එනම්, අඩු ආදායම්ලාභී පවුල්වල සාක්ෂරතාවය අතින් දියුණු, උසස් අධ්‍යාපනය ලැබූ යම් පිරිසක් ද සිටින බව යි. එසේ ම නාගරික අඩු ආදායම්ලාභී පවුල් යම් යම් අංශ කෙරෙහි සුවිශේෂී කුසලතාවයන් දක්වයි. එනම්, ඔවුන් නගරය කේන්ද්‍ර කරගනිමින් නාගරික ජීවන ක්‍රියාමාර්ගයන් හා ජීවන වෘත්තීන්ට එළඹ තිබේ. නාගරික අවකාශය හරහා තවදුරටත් අවිධිමත් අංශ නගර තුළ ව්‍යාප්ත කිරීමට මොවුන්ගෙන් දායකත්වය ලැබී ඇත. නිදසුන් ලෙස, ගෘහසේවිකාවන්, දිවා රාත්‍රි ආහාර සපයන්නන්, මඟී වෙළෙන්දන්, කසළ ඇහිඳින්නන්, දෛනික අත් උදව්කරුවන්, රෙදි සෝදන්නන් මෙන් ම නීත්‍යානුකූල නො වන මට්ටමින් වීදි ගණිකාවන්, මත් ද්‍රව්‍ය බෙදාහරින්නන්, කුළී පදනම මත අපචාර සහ අපරාධ ක්‍රියාවන් හි නිරත වන්නන් ආදී අවිධිමත් අංශයේ රැකියාවන් හි වර්ධනීය තත්ත්වයක් කොළඹ නගරය තුළ දැකිය හැකි සුවිශේෂී ලක්ෂණ ලෙස හඳුනා ගත හැක.

එසේ ම මෙම අඩු ආදායම් ලාභී ප්‍රජාවන්ගේ වාසස්ථාන බොහෝ දුරට දුම්රිය මාර්ග දෙපස, ඇළ මාර්ග දෙපස, මුඩු ඉඩම් හෝ රජයේ ඉඩම්වල නිත්‍යානුකූල නො වන මට්ටමින් අවකාශගත කර ඇත. එසේ ම සමාජය තුළ දී ඔවුහු තම සමාජ තත්ත්වය හැමවිට ම රහසක් ලෙස තබා ගැනීමට උත්සාහ දරයි. එය තවදුරටත් ඔවුන් එම ජනාවාස තුළට ම කේන්ද්‍ර ගත කරන්නට ප්‍රබල හේතුවක් වී තිබේ. මේ ආකාරයට නාගරීකරණය හේතුවෙන් කොළඹ නගරයේ අඩු ආදායම්ලාභී පවුල්වල ජනයාගේ සමාජ ජීවිතයේ සහ ඔවුන් නියුතු රැකියාවන් හි ව්‍යුහාත්මක වෙනසක් ඇති ව තිබේ. කෙසේ වුව ද මේ හේතුවෙන් තවදුරටත් නාගරික ගැටලු වර්ධනය වී ඇතිවා පමණක් නොව, ඔවුන් නාගරික අඩු ආදායම්ලාභී රාමුවෙන් ඔබ්බට යාම පිළිබඳ ව අවධානය තවදුරටත් යොමුකර නැති බව හෝ ශක්‍ති ලබන උත්සාහයන් අවම මට්ටමක පවතින බව පැහැදිලි ය.

## කොළඹ නගරයේ අඩු පහසුකම් සහිත ජනාවාස

"මුඩුක්කු" හා "පැල්පත්" (slums and shanties) නමින් අඩු ආදායම්ලාභීන්ගේ වාසස්ථාන වර්ග දෙකක් කොළඹ නගරය තුළ හඳුනා ගෙන තිබේ. ඉන් පළමුවැන්න කොටුවට උතුරින් හා පිටකොටුව ආශ්‍රිත ව පිහිටා තිබූ මධ්‍යම පාන්තිකයින් හා ඉහළ මධ්‍යම පාන්තිකයන් විසින් හැර දමා ගොස් තිබූ විශාල නිවාස වේ. අඩු ආදායම්ලාභීන් මේවායේ සමූහ වශයෙන් ජීවත් වූ අතර, විශාල පවුල් එක් කාමරයක හෝ කාමර දෙකක් තුළ අධික තදබදයෙන් යුතු ව ජීවත් වෙති (පෙරේරා, 2004). කොළඹ මහ නගර සභාවට අනුව මෙම ජනාවාස පැහැදිලි වර්ගීකරණයකට ලක් කර තිබේ. එනම්.

(අ) ඉතාමත් නොදියුණු ජනාවාස

(ආ) සේවා පහසුකම් ජනාවාස

(ඇ) වැඩි දියුණු කළ ජනාවාස හා

(ඈ) ඉතාමත් හොඳින් වැඩි දියුණු කළ ඒවා වශයෙන් ය.

මෙම වර්ගීකරණය සඳහා එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන යටතේ, "නාගරික පාලනයක් සඳහා වූ වැඩසටහන" මඟින් විවිධ නාගරික ජනාවාසවල ස්වරූපයන් හඳුනාගැනීම සංශෝධනයට ලක් කර ඇත. ඒ හේතුවෙන් මුඩුක්කු ප්‍රමාණය කොළඹ නගරය තුළ වැඩි වී ඇති අතර, (නිර්වචනාත්මක ව) පැල්පත් ප්‍රමාණය අඩු වී තිබේ.

වගු අංක 2

**කොළඹ නගරයේ අඩු පහසුකම් සහිත නිවාස ඒකක ගණන**

| ජනාවාස වර්ගය | නිවාස ගණන | |
|---|---|---|
| | 1976 | 1998 |
| පැල්පත් | 25,000 | 13,313 |
| මුඩුක්කු | 19,576 | 25,500 |
| අඩු වියදම් මහල් නිවාස | - | 8,950 |
| නැවත පදිංචි කරවූ නිවාස | - | 14,814 |
| පැරණි කම්කරු නිල නිවාස | 8,172 | 2,570 |
| අවිධිමත් ව තැනූ ස්ථිර නිවාස | - | 870 |

මූලාශ්‍රයඃ කොළඹ මහනගර සභාව, (1976). Clean Settlement Project-1998

ඉහත වගුවට අනුව, කොළඹ නගරයේ පැල්පත් සංඛ්‍යාවේ අඩු වීමක් පෙන්නුම් කෙරේ. මීට හේතුව වනුයේ, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ප්‍රධාන පරිපාලන මධ්‍යස්ථානය වුවත්, පරිපාලන කටයුතු බහුතරයක් තව ම කොළඹ නගරය වටා කේන්ද්‍ර ගත වී තිබීම යි. වාණිජ අගනගරය නිසාත්, ජාත්‍යන්තර සබඳතාවල දී සුවිශේෂීත්වයක් හිමිවන නිසාත්, පැල්පත් ඉදි කිරීමට තවදුරටත් භූමි භාගයක් සොයා ගැනීම දුෂ්කර වීම නිසාත් කොළඹ නගරයේ පැල්පත් සංඛ්‍යාව මෙලෙස අඩු වී තිබේ.

## තෙවැනි කොටස

## ප්‍රීමුස් ව්‍යාපෘතියේ කටයුතු සඳහා සහභාගිත්ව සංවර්ධන ප්‍රවේශයේ දායකත්වය

ජර්මන් තාක්ෂණික සහයෝගීතා ආයතනය සහ කොළඹ මහනගර සභාව එක් ව ක්‍රියාත්මක කෙරුණු "ප්‍රීමුස් ව්‍යාපෘතිය" (Participatory Improvement of Under Served Settlements – PRIMUSS) 2005 වසරේ ආරම්භ වූ අතර, එය 2010 වසර දක්වා ම ක්‍රියාත්මක වේ. මෙම ව්‍යාපෘතියේ මූලික අරමුණ වූයේ, නාගරික වශයෙන් අඩු පහසුකම් සහිත ජනාවාසවල ජීවත් වන ප්‍රජාවගේ සහභාගිත්වයෙන් හවුල්කාර පදනම යටතේ සංවර්ධන කටයුතු සිදු කිරීම යි. එහි දී අදාළ ජනතාව ඇතුළු පාර්ශ්වකරුවන් විසින් ව්‍යාපෘතියෙ හි කටයුතු හා එක් එක් ජනාවාස තුළ සිදුවෙමින් පවතින සහ පැවතීමට යෝජිත සංවර්ධන කටයුතු සඳහා ගිවිසගත් එකඟතා පිළිබඳ ව පැහැදිලි අවබෝධයකින් ක්‍රියා කරනු ලැබේ. අධ්‍යයනයට ලක් කළ "ප්‍රීමුස් ව්‍යාපෘතිය" ජර්මන් තාක්ෂණික සහයෝගීතා ආයතනය විසින් එසේ හවුල්කාර පදනමක් යටතේ ක්‍රියාවට නැංවෙන්නකි. එහි අරමුණ ප්‍රජා සහභාගිත්වයට වැඩි අවධානයක් යොමු කරමින් ජනාවාස සංවර්ධනයට ක්‍රියාකාරී දායකත්වයක් ලබා දීම යි. ඒ යටතේ නගරය සංවර්ධනය සඳහා පුද්ගලයින් දායක කරගැනේ. ව්‍යාපෘතිය කොළඹ නගරයේ අඩු ආදායම්ලාභී නිවාස සහ වතු ජනාවාස අරඹයා ක්‍රියාත්මක වේ.

කොළඹ නගරය ආශ්‍රිත ව "ප්‍රීමුස් ව්‍යාපෘතිය" යටතේ ක්‍රියාත්මක කෙරෙන සහභාගිත්ව ව්‍යාපෘති ගණන 75 කට ආසන්න වේ. අදාළ ව්‍යාපෘතිය හරහා ජනාවාසයන් හි ප්‍රජාව සවිබල ගැන්වීමකට ලක් කෙරෙන අතර, සහභාගිත්ව ක්‍රමවේදය ඒ සඳහා ඉවහල් කරගනී. මේ අනුව "ප්‍රීමුස් ව්‍යාපෘතිය" යටතේ තෝරා ගත් වතු දෙකකට එනම්, නවම් මාවතේ පිහිටි "වැකන්ද සීය වත්ත" ජනාවාසය සහ මරදාන විපුලසේන මාවතේ පිහිටි "25 වත්ත" ජනාවාස දෙකේ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම ප්‍රීමුස් ව්‍යාපෘතියේ මූලික අරමුණ විය.

ප්‍රීමුස් ව්‍යාපෘතිය තුළින් බලාපොරොත්තු වූයේ, ජනතාව සංවර්ධනයේ කේන්ද්‍රය වශයෙන් සලකා සංවර්ධන ව්‍යායාමය, දිළිඳුකම පිටු දැකීමේ ව්‍යායාමයට සමාන්තර ව පවත්වා ගැනීමත්, එය ඔවුන්ගේ නායකත්වයෙන් යුතු ව පවත්වා ගෙන යාමත් ය. තම ජනාවාසයේ අවශ්‍යතා පූර්ණය කරන තෙක් සියල්ලන් ම ඊට සහභාගි වීම, පිඹුරුපත් සකස් කිරීමට දායක වීම සහ අදාළ භූමිය පවිත්‍ර කිරීම, කාණු කැපීම, අනෙකා වෙනුවෙන් වැටුප් රහිත ශ්‍රමයෙන් දායක වීම යනාදියෙන් සහභාගිත්වය වර්ධනය කිරීමට ඔවුන් ගත් උත්සාහය පැහැදිලි වේ. මෙහි දී අවශ්‍ය නිලධාරි මඩුල්ල අදාළ ප්‍රජාවන් තුළින් ම තෝරා ගැනීමත්, එසේ ම එම නිලධාරීන් තුළින් සමස්ත ජනාවාසයේ කැමැත්ත සහ අභිප්‍රායයන් නියෝජනය වීමත් දැකිය හැක. සංවර්ධන ක්‍රියාදාමය සඳහා ජනතා සහභාගිත්වය ක්‍රමවත් කිරීමේ අරමුණින් එම ජනාවාස තුළින් ක්‍රියාත්මක ප්‍රජා සමිතිවල සහයෝගය ලබාගත් අතර, සමිති ක්‍රියාත්මක නොවූ "සීය වත්ත" ජනාවාසයේ අලුතින් ම ප්‍රජා සමිතියක් ස්ථාපිත කරන ලදී. එහි දී සමිති වාර පවත්වා ගැනීම සඳහා අවශ්‍ය ලියකියවිලි භාවිතය, තමාගේ අවශ්‍යතා තනි තනිව අදහස් මාර්ගයෙන් ඉදිරිපත් කිරීමට ඇති හැකියාව, ඡන්දය පාවිච්චි කිරීමට සහ බහුතරයේ කැමැත්ත යන්න වැදගත් සාධකයන් වීම මෙහි දී අවධාරණය කරන ලදී. ප්‍රීමුස් ව්‍යාපෘතිය මඟින් අදාළ ජනාවාස වාසීන් වෙත ජල සැපයුම, වැසිකිළි අපජල කළමනාකරණය, මතුපිට ජල කාණු පද්ධතිය සකස් කිරීම සහ අපද්‍රව්‍ය කළමනාකරණය ආදී ගැටලු සඳහා පිළියම් ලබා දීම සිදු කෙරිණි. මෙහි දී මූලික වශයෙන් ව්‍යාපෘතිය තුළ නාගරික ජල සැපයුම පොදු සහ පෞද්ගලික වශයෙන් හිමි කරදීමට කටයුතු කර තිබේ. එමඟින් ජනාවාස තුළ ඇති තදබදය දුරු කරගත හැකි වූ අතර, ජනාවාසය තුළ අපිරිසිදු වීම් වළක්වාලීමට මුළුතැන්ගෙයින් පිටවන අපජල කළමනාකරණය සඳහා මතුපිට කාණු පද්ධතියක් ස්ථාපනය කොට ඇත. ඒ සඳහා ව්‍යාපෘතිය සෙසු ආයතනයන් වන ජාතික

ජල සම්පත් හා ජලාපවහන මණ්ඩලය, අපද්‍රව්‍ය කළමනාකරණ මණ්ඩලය, ජාතික නිවාස සංවර්ධන අධිකාරිය හා කොළඹ මහනගර සභාවේ සහයෝගය ද ලබා ගෙන තිබේ. මෙය සහභාගිත්ව සංවර්ධනය පිළිබඳව වන මූලික දායකත්වයකි. එසේ ම මතුපිට කාණු පද්ධතියක් ඇති කිරීම හරහා වැහි වතුර ක්‍රමවත් ව බැස යාම හේතුවෙන් ජනාවාසවලට තිබූ ගංවතුර තර්ජනය මගහරවා ගැනීමට හැකි වී තිබේ. එසේ ම ඝන අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා ව්‍යාපෘතිය මගින් කුණු බාල්දි ලබා දී ඇති අතර, මහනගර සභාවේ මැදිහත්වීමෙන් ඒවා ඉවත් කිරීමට කටයුතු යොදා තිබේ. මෙහි දී පැහැදිලි වන්නේ ව්‍යාපෘතියේ මැදිහත් වීම හරහා ජනාවාසවල පැවති ප්‍රධාන ගැටලු අවම කිරීමටත්, නාගරික අඩු ආදායම්ලාභී ප්‍රජාවන් මුහුණ දී සිටින මූලික ගැටලුවලින් ඔවුන් මුදවා ගෙන ජීවන තත්ත්වය උසස් කිරීමටත් උත්සාහ ගෙන ඇති බව යි.

ව්‍යාපෘතියේ සියලු කටයුතු සිදු කෙරුණේ එම ජනාවාසවල ම වෙසෙන ප්‍රජාවගේ ශ්‍රම දායකත්වයෙනි. එනම්, ජල පහසුකම් ලබා ගැනීමේ දී බට දැමීම, කාණු කැපීම, කොන්ක්‍රීට් ඇතිරීම, පවිත්‍රතා කටයුතු යනා දී සියල්ල සිදු කෙරුණේ ප්‍රජා සහභාගිත්වයෙනි. ව්‍යාපෘතිය තුළ තීරණ ගැනීම්, ලියකියවිලිවල කටයුතු සිදු කෙරුණේ ප්‍රජා සමිතිවල සහභාගිත්වයෙනි. එනම්, තීරණ ගැනීම, පහළ සිට ඉහළට ක්‍රියාත්මක විය. මෙම ව්‍යාපෘතිය අධ්‍යයනයේ දී එය ඉතා සාර්ථක ක්‍රමයක් බවට හඳුනාගත හැකි විය. ව්‍යාපෘතිය මගින් සහනය ලැබූ පවුල් සංඛ්‍යාව 118 කි.

## දිළිඳු ප්‍රජාවගේ සංවර්ධනය කෙරෙහි ව්‍යාපෘතිය මගින් ලැබුණු දායකත්වය

මූලික ව ම මෙම ජනාවාස දෙකෙ හි ජීවත් වූ දිළිඳු ප්‍රජාව බොහෝ කලක් තිස්සේ අපේක්ෂාවෙන් සිටි මූලික අවශ්‍යතාවයන් හා බැඳුණු ගැටලු රැසක් මගහරවා ගැනීමට ව්‍යාපෘතිය හරහා හැකියාව ලැබී තිබේ. එනම්, පානීය ජලය, වැසිකිළි පහසුකම්, විදුලිය, ජලාපවහන පද්ධති යනා දී වශයෙනි. අනෙක් අතට ව්‍යාපෘතිය සඳහා ජනාවාසවල ප්‍රජාවගේ ශ්‍රම දායකත්වය ලබා ගැනීම හරහා පුද්ගල ඒකාබද්ධතාවයන් ඇති කරගැනීමට මං පෑදී ඇත. විශේෂයෙන් ම එකිනෙකා අතර වූ අමනාපකම් අමතක කොට තමන්ගේ ම වැඩක් සේ සිතා කටයුතු කිරීම තුළ එකිනෙකා අතර සමගියක් ද වර්ධනය වී තිබේ. එමෙන් ම ඒ හරහා සාමූහික විඥානයක් ද ගොඩනැඟී තිබේ. ඒ හරහා සියල්ලන් ම එක ම අරමුණක් වෙත මෙහෙයවීමට ව්‍යාපෘතිය හරහා හැකියාව ලැබී ඇත. ජනාවාසයෙ හි දියුණුව හුදු ව්‍යාපෘතියට පමණක් සීමා නො කර පිටස්තර සම්පත් පවා අනුබද්ධ කරගැනීමට පියවර ගෙන ඇත. විශේෂයෙන් ම මන්ත්‍රීවරුන්ගේ විමධ්‍යගත අරමුදල් ලබා ගැනීමේ දී පවා සම්බන්ධීකරණ ආයතන ලෙස ප්‍රජා සමිති වගකීම් සහගත ව ක්‍රියාකාරී දායකත්වය සපයා ඇත. එහි දී එම සමිති රැස්වීමේ අරමුණු, සමිතිවල ක්‍රියාත්මකභාවයේ පැන නඟින ගැටලු විසඳීම ආදී සම්බන්ධීකරණ කටයුතු සඳහා ව්‍යාපෘතිය මැදිහත්වීමෙන් අදාළ ප්‍රජා සංවර්ධන සමිතිවලට අවශ්‍ය දැනුම, ලියකියවිලි පරිහරණය කරන ආකාරය යනාදී පරිපාලන කටයුතු පිළිබඳ ව මනා දැනුමක් ලබා ගැනීමේ අවස්ථාව හිමි වී ඇත. ව්‍යාපෘතිය හරහා ප්‍රජාවගේ පෞරුෂ වර්ධනය සඳහා ද දායකත්වයක් සපයා ඇත. එනම්, වගකීම්සහගත නිලතල දැරීම, ගිණුම් පවත්වා ගෙන යාම හරහා මූල්‍යමය අංශයේ පාලනයත්, අදාළ ආයතන සමඟ විධිමත් ව ගනුදෙනු කිරීමටත්, එම නිලධාරීන් සමඟ අදහස් හුවමාරු කරගැනීමටත් මෙම ජනාවාසවල වෙසෙන ජනතාවට ව්‍යාපෘතිය හරහා හැකියාව ලැබී ඇත. එමෙන් ම මෙම අඩු ආදායම්ලාභී ප්‍රජාවගේ තිරසර ජීවන තත්ත්ව වැඩි දියුණු කිරීමේ ක්‍රමවේදයක් වශයෙන් සහභාගිත්ව සංවර්ධන ප්‍රවේශය මගින් ප්‍රජා කමිටු හරහා ජනාවාස බොහොමයක සංවිධානගත වීමේ අවශ්‍යතාවය දැඩි ව අවධාරණය කර තිබේ.

එමෙන් ම කාන්තා සහභාගිත්වය වර්ධනය කිරීම තුළින් ජනාවාස සංවර්ධනය කිරීමේ ක්‍රියාවලියට ඔවුන්ගේ දායකත්වය ලබා ගැනීම කෙරෙහි ව්‍යාපෘතිය ප්‍රබල බලපෑමක් සිදු කර ඇත. පුරුෂ පාර්ශ්වය ශ්‍රමයෙන් තම දායකත්වය ලබා දෙද්දී, කාන්තාවන් කමිටු සංවිධානය කිරීම, ප්‍රජා කමිටු සඳහා පවුල නියෝජනය කිරීම, තීරණ ගැනීමේ දී ක්‍රියාකාරී ව දායකත්වය ලබාදීම හරහා සංවර්ධන කාර්යයේ දී අමතක කළ නො හැකි චරිතයක් බවට පත් කර තිබේ. මෙම ව්‍යාපෘතිය මඟින් ලබාගත් ප්‍රජා සහභාගිත්වය හේතුවෙන් තවත් ආයතනයක සංවර්ධන ව්‍යාපෘතියක් නොව තමන්ගේ ම ව්‍යාපෘතියක් ලෙස පිළිගැනීමට මෙම ජනාවාසවල ප්‍රජාව පෙළඹී සිටිති. එය සහභාගිත්ව සංවර්ධන ප්‍රවේශය හරහා මෙම ව්‍යාපෘතිය සාක්ෂාත් කරගත් වර්ධනීය තත්ත්වයකි. මෙම ව්‍යාපෘති තමන්ගේ ම ව්‍යාපෘති බවට පත්වීමට අනෙක් ප්‍රධාන හේතුව වන්නේ, මෙම අඩු ආදායම්ලාභී ප්‍රජාව තවදුරටත් කොන්කර නො තබා ඔවුන්ගේ දායකත්වය, අදහස් යෝජනා අනුව එය ඔවුන්ගේ ම ව්‍යාපෘතියක් බවට පත් කිරීම නිසාවෙනි. මෙම ව්‍යාපෘතිය හරහා කාන්තාවට ද වැඩි නියෝජනයක් ලබා දී තිබීම තවත් විශේෂත්වයකි. ජනාවාස දෙකෙ හි ම ස්ත්‍රීන්ගේ දායකත්වය ඉහළ මට්ටමක පැවතිණි. එය 85% කට වඩා ඉහළ ප්‍රතිශත අගයකි. ප්‍රජා කමිටු පත් කිරීමේ දී නිලධාරී මඩුල්ල ඔවුන් අතරින් ම ඔවුන්ගේ මනාපය පරිදි පත් කිරීම සිදු විය. ඇතැම් වැඩ සඳහා ශ්‍රමදාන පැවැත් වූ අතර, ඒවා සඳහා ගෙවීමක් සිදු නො විය.

විසිපහ වත්ත, විපුලසේන ජනාවාසයේ සියලු ම නිවාසවලට ජල මුද්‍රිත වැසිකිළි ඇති අතර, ජල කරාම දෙක බැගින් හිමි වී තිබේ. එයට අමතර ව පොදු ජල කරාම දෙකක් සහ නාන කාමර 4 ක් ද, ජනාවාසයේ සකස් කර ඇත. භෞතික සැකැස්ම අතින් විපුලසේන මාවතෙ හි ද කොන්ක්‍රීට් බිමට අතුරා ඇති අතර, වතුර බැසයාම සඳහා මාර්ගයේ දෙපස කාණු පද්ධති ද සකස් කර තිබේ. එම කාණු ඇතැම් ඒවා විවෘත කොට ඇති අතර, ඇතැම් කාණු කොන්ක්‍රීට් පුවරු දමා වසා තිබේ. මේ හේතුවෙන් පරිසරයේ ඇති පවිත්‍රතාවය රැක ගැනීමට හැකියාව ලැබී ඇති බව ඔවුහු පවසති. සෞඛ්‍ය නිලධාරී දත්තවලට අනුව පැහැදිලි වූයේ, මැලේරියා සහ බරවා යන මදුරු රෝගවලින් 25% ක ප්‍රතිශතාත්මක ප්‍රගතියක් මෙම වත්තෙන් පළවන බව යි. ජලය ගලාගෙන යාම සඳහා කාණු පද්ධතියට අමතර ව මාර්ගය දෙපස පැති කාණු සකස් කිරීමෙන් වත්ත ජලයෙන් යටවීමේ අවදානම පහව ගොස් ඇති බව පෙනී යයි. එසේ ම වතු දෙකෙ හි ම පොදු වශයෙන් අභ්‍යන්තර මාර්ග සැලසුම්ගත ව වැඩි දියුණු කර තිබේ. මේ හේතුවෙන් ජලයෙන් යටවීම මෙන් ම අපිරිසිදු වීම් ආදියෙන් වැළකී සිටීමේ හැකියාව ජනාවාසීන්ට ලැබී ඇත.

වැකන්ද ජනාවාසයේ නිවාසවල තත්ත්වය පිළිබඳ අවධානය යොමු කිරීමේ දී දැකිය හැකි වූ ප්‍රධාන ලක්ෂණයක් වූයේ, පවුල්වලින් 80% ක් ම ස්ථිර නිවාසවල පදිංචි ව සිටීම යි. ඒ සඳහා ව්‍යාපෘතිය බලපා තිබේ. 25 වත්ත විපුලසේන මාවතේ නිවාසවල තත්ත්වය ද යහපත් ය. ඔවුන් සිය නිවාසය ඇතුළතින් පිළිසකර කිරීම් සිදු කරයි. ඉඩමට පූර්ණ අයිතිය හිමි නො වීමත්, රජයෙන් කෙදිනක හෝ තමන්ට ජනාවාසයක් ලැබේ ය යන හැඟීමත් ඔවුන් තුළ ඇත. නළ ජලය සැපයුම අතින් වැකන්ද ජනාවාසයේ පෞද්ගලික ජල සබඳතා ලබාගත් නිවාස ගණන 18 කි. එක් ජනාවාසයක් ජල සබඳතාව ලබාගෙන නොමැති අතර, 25 වත්ත ජනාවාසයේ නළ ජලය සියලු ම නිවාසවලට ලබා ගෙන ඇත. සෑම නිවසක ම ජල කරාම දෙකක් හෝ 3 ක් අනිවාර්යයෙන් ම දැකිය හැකි විය. නමුත් පැය 24 පුරා ම ජලය ලබා ගැනීමේ ගැටලුවට මොවුහු මුහුණ පා සිටිති. මෙම අඩු ආදායම්ලාභී ප්‍රජාවට ජලය ලැබෙන්නේ දිනකට පැය 10 කටත් වඩා අඩුවෙන් වීම ඊට හේතුව යි. මේ නිසා පෙර මෙන් උදෑසන සිට ජලය රැස්කර ගැනීමේ කටයුතු සිදු කිරීමට මොවුන්ට සිදු ව තිබේ. මෙය කලින් තිබූ අවස්ථාවට සමාන වුව ද නිදහස් හා ලිහිල්භාවයත්, පෞද්ගලිකත්වය ආරක්ෂා කර ගැනීමේ මානසික යහපතත් මොවුන් වෙත ලැබී ඇත. මේ හේතුවෙන් ජනාවාසයේ පෙර තිබූ තදබදය, ජලය නාස්ති වීම, මදුරු උවදුර පාලනය කිරීම ආදී කරදරවලින් තොර ව කටයුතු කිරීමේ හැකියාව ලැබී ඇත.

ජනාවාසයන් යුගලයේ ම පවුලේ ආදායම් තත්ත්වය සොයා බැලීමේ දී පැහැදිලි වූයේ, ස්ථිර රැකියාවේ යෙදෙන්නන් ජනාවාස යුගලයේ ම පිළිවෙළින් 30% ක සහ 50% ක ප්‍රතිශතයක් වූ බව යි. සෙසු අය අවිධිමත් අංශයේ නුපුහුණු ශ්‍රමිකයන් වශයෙන් සේවයේ යෙදෙති. එයින් ද 10% ක ප්‍රතිශතයකට රැකියා නොමැත. සෙසු පිරිස ස්වයං රැකියාවල යෙදෙන්නෝ වෙති. කිසිදු ආදායම් මාර්ගයක් නොමැති අය ද ජනාවාසවල වෙසෙන අතර, ඔවුන් සමස්ත ප්‍රතිශතයෙන් 5% ක් තරම් අතලොස්සක් වේ. ඔවුහු රජයෙන් ලැබෙන සහනාධාර මත ජීවත් වෙති. එසේ ම ජනාවාසයේ වෙසෙන කාන්තාවන්ගෙන් 95% ක් ම ස්වයං රැකියාවල සහ නිවාසවල මෙහෙකාර වෘත්තීන් හි යෙදෙති. ඇතැමුන් තම නිවාසයේ කොටසක් කුළියට දෙමින් ජීවත්වන අතර, සුවිශේෂීත්වය වූයේ ඇතැමුන් එම කුළිකරුවන් හා එක් ව ජීවත් වීම යි. මන්ද යත් තම නිවාස සඳහා ලබාගත් විවිධ සේවාවලට ගෙවීම් කිරීමත්, එවාට වූ ණය පියවීමටත් නිවැසියන්ට සිදුවීම නිසා පෙරට වඩා ආදායම් වර්ධනය කරගැනීමටත්, නව ආදායම් මාර්ග ඇති කර ගැනීමටත් ඔවුන් එමඟින් උත්සාහ දැරීම යි. මේවා ව්‍යාපෘතියෙන් සිදුවූ බලපෑම් ලෙස පෙන්වා දිය හැකි ය. එනම් ව්‍යාපෘතියෙන් ආර්ථික අවශ්‍යතා පුළුල් කිරීමට මෙන් ම ප්‍රවේශ වීම සඳහා වන අවශ්‍යතාවය ද ජනනය කර ඇත.

කොළඹ නගර සභාවෙන් දිළිඳු ප්‍රජාව සඳහා ලබාදෙන දිළිඳු සහනාධාර ද පවුල් කිහිපයකට ම හිමි ය. එය රුපියල් 1500 කට වඩා අඩු මාසික ආදායම් ලැබූවන්ට පමණක් හිමි වේ. නමුත් පර්යේෂණයේ දී පැහැදිලි වූයේ, එම සහනාධාරය එක ම නිවසේ පවුල් කිහිපයක් ම වෙන වෙන ම ලබා ගන්නා බව යි. වත්තෙ හි සාපේක්ෂ ජනගහනයෙන් හරි අඩක් ම කාන්තා ගෘහ මූලිකත්වය දරන පවුල් වේ. ගෘහමූලිකයා මියයැම සහ අතහැර යාමෙන් හිමිවුණු ගෘහ මූලිකත්වයට අමතර ව මුදල් ඉපයීම අතින් ද මේ ගෘහමූලිකත්වය හිමි කරගෙන ඇත. සම්මුඛ සාකච්ඡාවල දී ඇතැම් කාන්තාවන් විසින් පවසන ලද්දේ , "ගෘහ මූලිකයා යන්න හුදු ලේබලයක් පමණක් බව" යි. තමන් ප්‍රධාන උපයන්නා බව ඔවුහු පෙන්වා දෙති. ඒ සඳහා කාන්තාව එකවිට ස්වයං රැකියා කිහිපයක නිරත වීමක් දැකිය හැකි ය. උදාහරණ ලෙස අවට ආයතන වෙත දිවා ආහාර පාර්සල් ලබාදීම, උදෑසන ආහාරය පිළියෙළ කර කඩවලට සැපයීම, ඇඳුම් මැසීම, රෙදි සේදීම ආදිය දැක්විය හැකි ය.

ප්‍රජා සමිතිවල සිදුවන ක්‍රියාකාරිත්වය අතින් වැකන්ද ජනාවාසයට වඩා 25 වත්ත විපුලසේන මාවත ජනාවාසය ඉදිරියෙන් සිටියි. ඔවුන්ට ප්‍රජා ශාලාවක පහසුකම් හිමි ව ඇති අතර, සාක්ෂරතාවය හා දැනුම්වේදය අතින් වැකන්දවත්ත ජනාවාසයට වඩා අත්දැකීම් සහිත ව ඉදිරියෙන් සිටී. ඔවුන් මසකට වරක් සමිති වාර පවත්වන අතර, සාමාජික මුදල් වශයෙන් රුපියල් 10 ක් අය කරගනී. නමුත් අධ්‍යයනය සිදු කරන කාලය තුළ දී මාස 6 ක සිට ඔවුන් සමිති වාර පවත්වා නැත. වැකන්දවත්ත ජනාවාසයේත් මසකට වතාවක් සමිති වාර පැවැත්වෙන අතර, රුපියල් 25 ක සාමාජික ගාස්තුවක් ඔවුන් අයකර ගනු ලබයි. එවා වැසිකිළි නළ මාර්ග, ජල මාර්ග කාණු ආදියේ නඩත්තු කටයුතු සඳහා යොදා ගනී. ප්‍රජා ශාලාවක පහසුකම් මේ ජනාවාසයේ අයට නැති හෙයින් ඔවුන් ජනාවාසයේ නිවසක් ඒ සඳහා තෝරා ගෙන ඇත. තම පවුලේ සාමාජිකයෙකු හෝ අඩුම තරමින් රැස්වීම්වලට සහභාගී කරවීමට ඔවුහු කටයුතු කරති. නමුත් මාස එකහමාරක පටන් (පර්යේෂණ සිදු කරන දිනය වන විට) ප්‍රජා සමිතිය රැස් වී නොමැත. එයට හේතු වූයේ අවුරුදු දින, වෙසක් දිනය ආදී උත්සව කටයුතු සඳහා වෙන් වූ කාලවල දී අමතර ආදායම් මාර්ගවල නිරත වීම මෙන් ම අවිධිමත් අංශයේ රැකියාවල ඇති කාර්යබහුලත්වය යි. එසේ ම නිවාඩු දිනයන් වැඩි වශයෙන් තිබීම නිසා පාසල් දරුවන් නිවාසවල රැඳීමත්, ඔවුන්ට ලබාදෙන විෂය බාහිර ක්‍රියාකාරකම් සඳහා උපකාර කිරීමට දෙමාපියන්ට සිදුවීමත් මත මෙම සමිති වාර පැවැත්වීමේ නො හැකියාවක් මතු ව තිබේ. සාමාජික මුදලක් ලබා ගැනීමේ දී හැමවිට ම එකවර සාමාජික මුදල් අයකර ගැනීමට හැකි වී නොමැත. රැකියා මෙන් ම ආදායම් නො ලබන පවුල්වල සාමාජිකයින් ජනාවාසවල රැඳී සිටීම

එයට හේතුව යි. මේ හේතුවෙන් ප්‍රජා ක්‍රියාකාරිත්වයත් තුළ දී ගැටලුසහගත අවස්ථාවන් ඇති කිරීම සඳහා ද මෙය බලපා තිබුණි.

පර්යේෂණය මගින් පැහැදිලි වූයේ, මෙම ජනාවාසය තුළ ප්‍රජා ක්‍රියාකාරී කම්ටු තිබුණ ද ඒවා පවත්වාගෙන යාමට නිසි වාසස්ථානයක් නොමැති වීම ජනාවාසයේ ප්‍රගමනය කෙරෙහි බලවත් පාඩුවක් ඇති කරන බව යි. එසේ ම ප්‍රජා ශාලාවක් තිබූ ජනාවාසයෙ හි රැස්වීම් නො පැවැත්වීමට කටයුතු කිරීම ද ගැටලුකාරී වාතාවරණයන් ඇතිකිරීමට හේතු වී තිබේ. උදාහරණ ලෙස සාමාජික මුදල් අය කළ ද ඒවා වංචනික ලෙස භාවිත කිරීම, රැස්වීම් කටයුතු පෞද්ගලික නිවසක් තුළ පැවැත්වීමෙන් ඇතැමුන් එය ඒකාධිපති ඒකාංශ පරිහරණයක් ලෙසට දකින ආකාරයක් ද පෙනේ. සම්බන්ධතා දියුණු වීමට මෙන් ම යම් යම් සමාජ සබඳතාවල විශ්වාසනීයත්වය පළුදු කිරීමේ වාතාවරණයක් මෙම තත්ත්වයන් මත ඇති ව තිබේ. එය වඩා හොඳ සමාජ සබඳතා ඇති කිරීමට එරෙහි ව බලපෑමක් සිදු කර තිබේ. එසේ ම ඇතැම් කම්ටු නායකයින් දේශපාලනික බලවතුන් සමග වන සම්බන්ධතා තුළ දී පොදු පහසුකම් භුක්ති විඳීනවාට වඩා පෞද්ගලික වාසි අත්පත් කරගැනීමට කටයුතු කිරීම බාධාවක් වී ඇත. විපුලසේන මාවත 25 වත්ත ජනාවාසයේ එවැනි බල ව්‍යුහයන් සූක්ෂම ආකාරයෙන් ක්ෂුද්‍ර තලයේ ක්‍රියාත්මක වන ආකාරයක් පෙනී ගියේ ය. එය ද කම්ටු සාමාජිකයින් අතර නායකත්වයට ඇති ගරුත්වය අඩුවීම කෙරෙහි බලපෑමක් එල්ල කර තිබේ. එසේ ම ප්‍රජා ශාලාවක් නොමැති වීමෙන් අවශ්‍යතා ඉටු කරගැනීමේ දීත්, පොදු වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ දීත් බාධාවන් රැසක් එල්ල වී තිබුණි.

එසේ ම පර්යේෂණයේ දී පැහැදිලි වූයේ, ව්‍යාපෘතිය පැමිණීමට පෙර නො තිබූ මූල්‍යමය ඉතිරියක් දැන් සිදුවන බව යි. එනම් ව්‍යාපෘතිය එමට පෙර පැවති ඉතුරුම් ක්‍රම සහ ණය වැඩසටහන්වල දී ණය වැඩසටහන්වලට තිබූ ප්‍රමුඛතාවය වැඩි ය. නමුත් දැන් ණය වැඩසටහන් සඳහා පවතින අවබෝධාත්මක තත්ත්වය මෙන් ම ඉතිරි කිරීම් සඳහා වන නැඹුරුතාවය වැඩි වී ඇත. සම්මුඛ සාකච්ඡාවලින් පැහැදිලි වනුයේ, මෙම පිරිස තුළ තම නිවාසය අළුත්වැඩියා කිරීම කෙරෙහි සහ නිවසට අංගෝපාංග ඇතුළත් කිරීම කෙරෙහි යම් බලපෑමක් කිරීමට ව්‍යාපෘතිය සමත් ව ඇති බව යි. මේ ආකාරයට පරිසරයේ භෞතික සැකැස්ම කෙරෙහි ද, ආර්ථික කටයුතුවල වෙනස්වීම් කෙරෙහි ද, සමාජ සබඳතා තහවුරු කිරීම කෙරෙහි ද ව්‍යාපෘතිය ඍජු හා වක්‍ර ලෙස බලපා ඇත.

## 4. නිගමන

සමස්ත අධ්‍යයනයට අනුව, තිරසර නාගරික සංවර්ධනයක් සඳහා නාගරික සංවර්ධන ව්‍යාපෘතීන් හි දී සහභාගිත්ව සංවර්ධන ප්‍රවේශය ඉතා යෝග්‍ය බව පෙනී යයි. මන්ද, මෙම වතුවල මීට පෙර ද යම් යම් ව්‍යාපෘතීන් ක්‍රියාත්මක වී තිබුණ ද ඒවා ප්‍රජා සහභාගිත්ව ක්‍රමවේදයන් ඔස්සේ ක්‍රියාත්මක නො වීම හේතුවෙන් ඒ පිළිබඳ ව ප්‍රජාව තුළ යහපත් ප්‍රතිචාරයක් ඇති වී නොමැති නිසා ය. එහෙත් ප්‍රජා සහභාගිත්වය පදනම් කරගත් මෙම ව්‍යාපෘතිය ඉතා සාර්ථක මට්ටමක පවතින බව ප්‍රජා අදහස්වලින් මෙන් ම දෘශ්‍යමාන ව ද පෙනී යන සත්‍යයකි.

මෙහි දී බොහෝ විට පොදු පහසුකම් පෞද්ගලික වශයෙන් ලබා ගැනීමට ඇති කැමැත්ත සඳහා සාමූහික දායක වීමක් දැකිය හැකි විය. එමෙන් ම සහභාගිත්ව ක්‍රමවේදය මගින් ප්‍රීමුස් ව්‍යාපෘතිය හරහා ආරම්භ කළ ප්‍රජා මූලික කම්ටුවල ක්‍රියාකාරිත්වය වඩා සාර්ථක තීරණ ගැනීමට හේතු වී ඇත. එනම්, දිළිඳු බව තුළ නාගරික ගැටලු අවබෝධ කරගැනීමටත්, සංවාද වැඩමුළු පැවැත්වීම මගින් අදාල පාර්ශවයන් හි අදහස් හා යෝජනා ලබා ගැනීමෙන් වඩා සාර්ථක ව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට හැකියාවන් ලැබී තිබිණි. එමෙන් ම ඒ මගින් මෙම ප්‍රජාව ඍජුව ම තීරණ ගැනීමේ ක්‍රියාවලියට දායක කරගත හැකි වීමෙන් වඩා සාර්ථක ප්‍රතිඵල

ලැබීමට හේතු වී ඇත. එමෙන් ම සහභාගිත්වය තුළ දී "හවුල්කාරිත්වය" යන සංකල්පය පිළිබඳ ව මනා අවබෝධයක් ව්‍යාපෘතිය හරහා ප්‍රජාව වෙත ලබා දී ඇත. එනම් අඩු ආදායම්ලාභී ප්‍රජාව තවදුරටත් ආධාර ලබන්නකු නොව, නගර සංවර්ධනයට දායකත්වය සපයන හවුල්කාර පාර්ශ්වයක් ලෙසට අවබෝධ කරගැනීම යි. එසේ ම ඔවුන් ප්‍රායෝගික ලෙස ඊට සම්බන්ධ කරගැනීමෙන් ඔවුන් වෙත වගකීම් විතැන් කිරීමේ හැකියාව සහභාගිත්ව සංවර්ධන ප්‍රවේශය හරහා ලැබී ඇත. මෙම වගකීම යන සාධකය මගින් ජනාවාස මට්ටමින් එම වගකීම් ඉටු කිරීමට ප්‍රජා සංවිධාන නැඹුරුතාවක් දැක්වීම ද මෙහි දී පැහැදිලි ව දැකගත හැකි විය.

මේ ආකාරයට සහභාගිත්ව සංවර්ධන ප්‍රවේශය මගින් ප්‍රජාවන් සවිබල ගැන්වීමත්, වගකීම් දැරීමට හුරු කිරීමත් ඒ හා අදාළ නිල කටයුතු හා ලේඛන ආදිය පවත්වා ගෙන යාම වැනි පරිපාලන කටයුතු සඳහා වන ඥානය ලබාදීමත් සිදුකර තිබේ. එසේ ම ශ්‍රමය පිළිබඳ ව තවදුරටත් විශ්වාසය තැබීමත්, එම ශ්‍රමය හුවමාරු තත්ත්වයකට පත් කිරීම තුළින් ඔවුන් අතර ශ්‍රමික අනුකලනයක් ඇති කිරීමටත් එය හේතු වී ඇත. සමස්ත අධ්‍යයනය තුළ දී වැදගත් ප්‍රවණතාවන් කිහිපයක් ම හඳුනාගත හැකි විය. එනම්, පොදු පහසුකම් පෞද්ගලික වශයෙන් ලබා ගැනීමට ඇති කැමැත්ත පිළිබඳ ව සාමූහික දායකත්වයක් මෙම ව්‍යාපෘතිය තුළ දැකගත හැකි වීම යි. මෙම සාමූහික දායක වීම තුළ ලබාගත් ප්‍රතිඵල භුක්ති විඳීමේ දී ඒවා මුළුමනින් ම පරිහරණය කිරීමක් අදාළ ජනාවාස තුළ දැක ගත හැකි වූයේ නැත. උදාහරණ ලෙස තවදුරටත් පොදු පහසුකම් සඳහා වන උනන්දුව දැකගත හැකි වූ අතර, වියදම් පාලනය කිරීම සඳහා මෙම පිරිස පොදු අවශ්‍යතා සඳහා යොමුවන ආකාරය දැකගත හැකි විය. ජනාවාසයන් දෙක ම අඩුවැඩි වශයෙන් එම තත්ත්වයන් කරා යොමුවීමක් දැකිය හැකි වූ අතර, ව්‍යාපෘතියේ මුඛ්‍ය පරමාර්ථය හා අරමුණු අතර යම් නො ගැළපීම්වලට මෙය හේතු වී ඇත. කෙසේ වෙතත් නාගරික අඩු ආදායම්ලාභී නිවාසවල පවතින තදබදය හා පරිසරය වඩා පවිත්‍ර ස්ථානයක් බවට පත් කිරීමට ගත් උත්සාහය ව්‍යර්ථ වීමට මූලික ම හේතුවක් ලෙස බහුතර පිරිස නැවතත් පෞද්ගලික අවශ්‍යතා පරිහරණයෙන් මිදී පොදු අවකාශය භුක්ති විඳීම සඳහා නැවතත් යොමු වීම දැක්විය හැක.

එසේ ම මෙම අධ්‍යයනයෙන් තහවුරු වූ තවත් කරුණක් වන්නේ, නාගරික දිළිඳුකම අවම කිරීම සඳහා සහභාගිත්වය ක්‍රමවේදයක් ලෙසට යොදා ගැනුණ ද තවදුරටත් ජනාවාසවල ජනතා හඬට ඉඩක් ලැබුණා ද යන්න ගැටළුසහගත වීම ය. සම්මුඛ සාකච්ඡා, ප්‍රත්‍යක්ෂ අධ්‍යයනවල දී සහ සමිතිවල සභාවාර සඳහා දායක වූ අවස්ථාවන්වල දී ඔවුන්ගේ අදහස්වලට ඉඩක් ලැබේ ය යන විශ්වාසය ජනතාව තුළ ගොඩනැඟී තිබීමට අමතර ව ආයතනික නිලධාරීන් ලබාදුන් න්‍යාය පත්‍රවලට අනුව ජනතාව කටයුතු කිරීමත් දැකගත හැකි විය. මෙම ප්‍රජාව තුළ යම් යම් නව අදහස් තිබුණත් ඒවා ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ප්‍රවේශයන් ලබා ගැනීමේ සහ ඒවාට එළැඹීමේ මූලික දැනුවත්භාවයන් ඔවුන් තුළ දක්නට නො විය. අනෙක් අතට සහභාගිත්ව සංවර්ධනය යන්න තුළ දී "තමා සහභාගිත්වයේ කොටස්කරුවෙක්"ය යන හැඟීම වෙනුවට ඔවුන් තුළින් දිස් වූයේ "තමන් එම සංවර්ධන ක්‍රියාවලියේ ප්‍රතිඵල භුක්ති විඳින්නකු" යන හැඟීම පමණි.

ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය


1. අබේරත්න, උපුල්, (1997). සහභාගිත්ව සංවර්ධනය සහ ජනසවිය වැඩපිළිවෙළ. කර්තෘ ප්‍රකාශන.

2. ඒකනායක, ඊ. එම්. එස්. (2004). 'ගැමි දිළිඳුකම සහ බලසතුකරණ න්‍යාය', ඉඳුවර පර්යේෂණාත්මක ලේඛන සංග්‍රහය 2. ආරිය ප්‍රකාශකයෝ, වරකාපොළ.

3. පෙරේරා, නිහාල් (2004). 'යටත් විජිත නගරය දේශීය කිරීම: 19 වන සියවස අගභාගයේ කොළඹ සහ එහි භූමි දර්ශනය'. පඨිත-සමාජ සංස්කෘතික සමීක්ෂා දෙවන වෙළුම. කොළඹ.

4. මාර්ග ප්‍රකාශන, (1980). කොළඹ නගරයේ අවිධිමත් ව්‍යාපාර අංශය. මාර්ග ආයතනය, කොළඹ.

5. විග්නරාජා, හෙන්නා (1990). 'දකුණු ආසියාවේ දුප්පත්කම අවම කිරීම පිළිබඳ න්‍යාය හා භාවිත'. ආර්ථික විමසුම, අගෝස්තු කලාපය. පර්යේෂණ අංශය, මහජන බැංකු ප්‍රධාන කාර්යාලය, කොළඹ.

6. ශ්‍රී ලංකා මහ බැංකුව, (2002). වාර්ෂික වාර්තාව. විශ්වලේඛා, රත්මලාන.

7. සෙවනත නාගරික සම්පත් මධ්‍යස්ථානය, (2001). නාගරික අඩු ආදායම් ජනාවාස වර්ගීකරණය කිරීමේ නිර්නායක. නාගරික සම්පත් මධ්‍යස්ථානය, කොළඹ.

8. සෙවනත නාගරික සම්පත් මධ්‍යස්ථානය, (2002). 'ප්‍රජාව බලගැන්වීම තුළින් නාගරික දුප්පත්කම අවම කිරීමේ ව්‍යාපෘතිය'. නාගරික දිළිඳුකම පැතිකඩ වාර්තාව. කොළඹ.

9. Bastian, Sunil, Nicola, Bastian.(1996). Assessing Participation. A Debate from South Asia. Delhi, konark publishers (Pvt) Ltd.

10. Chamber, R. (1995). Poverty and Livelihoods whose Reality Counts. Environment and Urbanization, vol: vii

11. Chopra, Kanchan.(1990). Participatory Development. Madras. Sase publications

12. Clean Settlement Project,(1998). Information Profile. Colombo Municipal Council.

13. Robin, C. (1996). Theories of Migration. Cheltenham, UK ,Brookfield, Vt.

14. Department of Census and Statistics, (2004). Sri Lanka Census of Population and Housing- 2001. Population and Housing Data City of Colombo. (Colombo Municipal Council). September.

15. Turner, J.F.C. (1976). Housing by People. London, Marion.

16. United Nation, (2003). The Challenge of Slums Global Report on Humen Settlement.